අපි වෙනුවෙන් අපි අරමුදල - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

අපි වෙනුවෙන් අපි අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු , 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ ඇතුළත් කර ඇත.

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රණජයපුර නිවාස සංකීර්ණයෙහි නිවාස වාරික ආදායම සම්බන්ධයෙන් ලැබියයුතු වාරික ආදායම, ඉදිරියට කළ ගෙවීම්, වර්ෂයට අදාල වාරික ආදායම ආදිය සඳහා වෙන් වශයෙන් ලෙජර ගිණුම් පවත්වා නොතිබුණු අතර සියළු ගණුදෙනු පාලක ගිණුමක් මගින් පමණක් ගලපා තිබුණි. ඒ හේතුවෙන් හිග වාරික, කලින් ලද වාරික හා වර්ෂයට අදාල ආදායම ආදියේ නිරවද්‍යතාව සනාථකරගත නොහැකි විය.	විගණන නිරීක්ෂණයට අනුව ලැබිය යුතු ආදායම, කලින් ලද වාරික මුදල් සහ වර්ෂයට අදාල වාරික ආදායම සඳහා වෙන් වෙන් වශයෙන් ගිණුම් පවත්වා ගෙන යාමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව.	වාර්ෂික ආදායම,හිඟ ආදායම හා කලින් ලද ආදායම නිවැරදිව හඳුනාගත හැකි පරිදි ගිණුම් පවත්වා ගත යුතු වීම.
(ආ)	රණවිරු නිවාස ව්‍යාපෘතියේ නිවාස ව්‍යාපෘති උපචිත පරිපාලන වියදම් ලෙස මුළු ව්‍යාපෘති වටිනාකමින් සියයට 2 ක් හෙවත් රු.5,533,942 ක්, සමාලෝචිත වර්ෂයේ අතිරික්තයට එරෙහිව ලියාහැර තිබුණු නමුත් පූර්ව වර්ෂවල නිවාස ව්‍යාපෘතියේ උපචිත පරිපාලන වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණු රු.12,132,959 ක මුදලින් කිසිදු ගෙවීමක් සිදුකර නොතිබුණි.	2023/2024 වර්ෂයේ නිවාස ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක වන බැවින් කළමණාකරන මණ්ඩල අනුමැතියන් මත පරිපාලන වියදම් නිදහස් කිරිමට සහ පරිපාලන වියදම් ලබාදිමට ප්‍රථම වැය වාර්තාවක් ගෙන්වා ගැනිමට කටයුතු කරනු ලබන අතර යම් ඉතිරි මුදල් පවති නම් එය අරමුදල වෙත ගෙන්වා ගැනිමට කටයුතු කරනු ලැබේ.	සත්‍ය වියදම නිශ්චිතව හදුනාගත් පසු වර්ෂය අවසන් වන විටත් ගෙවා නොමැති වියදම් උපචිත වියදම් ලෙස හඳුනාගැනීමත්, සෙසු අවිනිශ්චිත වියදම් සඳහා වෙන්කිරීම් කිරීමත් සිදුකළ යුතුය.

1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 90 ඡේදය වත්කම් ප්‍රත්‍යාගණිත අගයන්ට ප්‍රකාශ කර ඇති විට ප්‍රමිතය ප්‍රකාරව අදාල කරුණු හෙළිදරව් කළ යුතු වුවත්, අරමුදලෙහි ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය තුලින් රු.440,982 ක ප්‍රත්‍යාගණන ලාභයක් හඳුනාගෙන ඇතත් ඉහත ගිණුම්කරණ ප්‍රමිතිය අනුව හෙළිදරව් කර නොතිබුණි.	ඉදිරි වර්ෂයන් හිදී වත්කම් ප්‍රත්‍යාගණන අගයන්ට අදාල හෙළිදරව් කල යුතු දෑ මූල්‍ය ප්‍රකාශනය තුල සටහනක් මගින් පෙන්වීමට කටයුතු කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 90 ඡේදය ප්‍රකාරව අදාල හෙළිදරවු කිරීම් කිරීමට කටයුතු කල යුතුය.

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හා එහි සංශෝධිත පනත් ප්‍රකාරව, අරමුදල විසින් උපයනු ලබන ආදායම් සම්බන්ධයෙන් බදු බැදියාවක් පැවතියද, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන බදු කාර්යයන්ට අනුගතවන පරිදි පිළියෙල කර නොතිබුණු අතර අරමුදලේ ආයෝජන පොලී ආදායමෙන් අවකරණය කළ රු.9,077,055 ක රඳවාගැනීම් බදු මුදල අරමුදලේ වියදමක් ලෙස අතිරික්තයට එරෙහිව ලියාහැර තිබුණි.	අපි වෙනුවෙන් අපි අරමුදල විසින් උපයනු ලබන මුදල් ප්‍රමාණ, 2017 අංක 24 දරන දේශිය ආදායම් පනතේ තුන්වන උපලේඛණයේ දැක්වෙන ආදායම් බද්දෙන් නිදහස් මුදල් ප්‍රමාණ ලෙස සැලකිය නොහැකි බව දේශිය ආදායම් දෙපාර්තමේන්තුව මගින් දැනුම් දී ඇත.	2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හා එහි සංශෝධිත පනත් ප්‍රකාරව, බදු වාර්තා ඉදිරිපත් කිරීමත්, බදු කාර්යයන්ට අනුගතවන පරිදි ගිණුම් පිළියෙල කිරීමත් සිදුකළ යුතුය.

1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සම්ප්‍රේෂණ කුළුණු ආදායම්	26,778,441	ලැබිය යුතු ආදායම සනාථ කර ගැනීමට ශේෂ සනාථකිරීම් ඉදිරිපත් කර නොතිබුණු බැවින් ලැබියයුතු ආදායමේ නිරවද්‍යතාව තහවුරු කරගත නොහැකි විය.	ඉදිරියේදී ලැබිය යුතු අදායම පිළිබඳ ශේෂ සනාථ වාර්තා ගෙන්වා ගැනිමට කටයුතු කරනු ලැබේ.	වර්ෂ අවසාන ලැබියයුතු ශේෂ සඳහා සනාථ කිරීම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	රණජයපුර නිවාසයන්හි වාරික ආදායම්	70,580,963	රණජයපුර නිවාසයන්හි වාරික ආදායම ලෙස ආදායම් ප්‍රකාශයේ දැක්වෙන රු. 70,580,963 ක අගය ගණනය කළ ආකාරය	නිවාස වාරික ආදායම ගණනය කිරීමේදී ත්‍රිවිධ හමුදා සමාජිකයන්ගේ නාම	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා ශේෂයන්, නිශ්චිතව හඳුනාගත හැකිවන

			දැක්වෙන විස්තරාත්මක උපලේඛණ ඉදිරිපත් නොවුණි.	ලේඛණ වෙන් වෙන් වශයෙන් පවත්නා අතර පෙන්වා දී ඇති පරිදි එක් ලේඛණයක් පවත්වාගෙන යාමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	පරිදි ඊට අනුරූප උපලේඛණ ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	සම්ප්‍රේෂණ කුළුණු ආදායම	166,684,058	අරමුදල විසින් දූරකථන සමාගම් සමඟ එළඹ තිබුණු ගිවිසුම් ප්‍රකාරව ආදායම හඳුනාගත යුතු වුවද, එම සමාගම් විසින් අරමුදලේ බැංකු ගිණුමකට බැර කරනු ලබන ප්‍රේෂණ සහ එම සමාගම් ඉදිරිපත් කරනු ලබන ලේඛණ මත පදනම්ව සම්ප්‍රේෂණ කුළුණු ආදායම හඳුනාගෙන තිබුණි. එහෙත් එම ආදායම නිවැරදි බවට සහතික කර ගැනීමේ ක්‍රමවේදයක්ද ක්‍රියාත්මක කර නොතිබුණු බැවින් ප්‍රවර්ථන වර්ෂයේ රු. 166,684,058 ක් වූ සම්ප්‍රේෂණ කුළුණු ආදායම හා උපචිත කුළුණු ආදායම රු.26,778,441 යන වටිනාකම්වල නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකිවිය.	අන්තර්ජාල, දේශීය සහ විදේශීය ඇමතුම් ජාල වැනි සංකීර්ණ සම්ප්‍රේෂණ දත්ත ප්‍රමාණයන්හි ආදායම නිශ්චිතවම ගණනය කිරීමට නොහැකිවීම හේතුවෙන් සම්ප්‍රේෂණ කුළුණු ආදායම සඳහා ඉන්වොයිස් පිළියෙල කල නොහැකි අතර ඒ සඳහා අමාත්‍යාංශයේ තාක්ෂණික අංශය දැනුවත් කර ඇතත් එකඟතාව පළකර නොමැති බව.	ගිවිසුම් ප්‍රකාරව ලැබිය යුතු ආදායම නිවැරදි ගණනය වන බවට තහවුරු වන ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය.
(ඈ)	කුළුණුවල ආදායම	164,130,928	දූරකථන සමාගම් දෙකක් සමග වසර 10 ක කාලයක් ආවරණය වන පරිදි ඇතිකරගත් අවබෝධතා ගිවිසුම් අනුව කුළුණුවල මුළු ආදායමෙන් සියයට 50 ක් අරමුදලට ගෙවන බවට සඳහන් වුවත් දූරකථන සමාගම් විසින් එවා තිබුණු ලේඛණවල අදාල කුළුණුවල මුළු ආදායම සඳහන් නොවීම හේතුවෙන් ගිවිසුම් අනුව අරමුදලට ලැබිය යුතු නිවැරදි ආදායම ලැබුනේද යන්න තහවුරු කල නොහැකි විය. ඒ හේතුවෙන් ගිණුම්ගතව ඇති රු. 164,130,928 ක් වූ එම සමාගම් දෙකෙන් ලද ආදායමේ නිරවද්‍යතාව තහවුරු කරගත නොහැකි විය.	අවබෝධතා ගිවිසුමේ 4.1.3 වගන්තියේ දැක්වෙන නෛතික කරුණ පිළිබඳව නැවත සමාලෝචන කල යුතුව ඇති බැවින් මෙම අවබෝධතා ගිවිසුම තාක්ෂණික අංශය වෙත ඉදිරිපත් කර ඉදිරි උපදෙස් ලබාගැනිමට කටයුතු කරනු ලබන බව.	ගිවිසුම් ප්‍රකාරව දූරකථන කුළුණු ආදායම නිවැරදිව ගණනය කර ගිණුම්ගතකරන බවට තහවුරු වන ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට රණජයපුර නිවාස හිමියන්ගෙන් අයවිය යුතු හිඟ වාරික මුදල රු. 31,359,101ක් වූ අතර එයින් වර්ෂ 1 සිට 5 දක්වා කාලයක් හිඟහිටි ශේෂයන්ගේ එකතුව රු. 14,802,000 ක් වූ අතර වසර 05 ට වැඩි කාලයක් හිඟහිටි ශේෂ එකතුව රු.3,648,000 ක් වූයෙන් කාලීනව වාරික මුදල් අයකර ගැනීමේ දුර්වලතාවක් පැවතුණි.	රණජයපුර නිවාසලාභීන්ගෙන් අයවිය යුතු හිඟ වාරික මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ත්‍රිවිධ හමුදා අංශයන් වෙත ලිපි මගින් දැනුම්දී ඇති අතර ඉදිරියේදී එම හිඟ වාරික කඩිනමින් අයකර ගැනීමට කටයුතු සිදුකර ඇති බව හා විශ්‍රාම වැටුප සැකසීමේ ප්‍රමාද, සේවය හැරයාම, මියයාම ආදීය හේතුවෙන් මාසික වැටුපෙන් වාරික මුදල් අයකර ගත නොහැකිවීම හා ස්ථිර පදිංචිය වෙනස්වීම යනාදී කරුණු හිඟ වාරික මුදල් ඉහල යාමට හේතුවන බව.	නිවාස හිමියන්ගෙන් අයවිය යුතු හිඟ මුදල් ගිවිසුම් ප්‍රකාරව කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය.
(ආ)	කුළුණු ආදායම සම්බන්ධයෙන් දුරකථන සමාගම් සමඟ එකඟවූ ගිවිසුම් අනුව යම් මාසයකට අදාල කුලිය ඊළඟ මාසය තුළ අරමුදලට ගෙවියයුතු වුවත් මාස දෙකකට අධික කාල පමාවක් සහිතව ගෙවීම් සිදුකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 15,018,841 ක මුදලක් හිඟහිට පැවති අතර ගිවිසුම් ප්‍රකාර ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.	හිඟ ආදායම අයකර ඇති අතර තවදුරටත් ලැබිය යුතු රු. 5,539,338 ක හිඟහිටි ආදායම අයකර ගැනිම සඳහා සියළුම සමාගම් දැනුවත් කළ බව හා ගිවිසුම ප්‍රකාරව අදාල මාසය අවසානයේදීම කුළුණු ආදායම් අයකර ගැනිමට කටයුතු කරනු ලබන බව.	ගිවිසුමේ සඳහන් පරිදි ආදායම් කාලීනව රැස් කිරීමට හා ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කල යුතුය.
(ඇ)	රණජයපුර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 18 ක් බදු දීම සඳහා වූ ගිවිසුමේ 2.අ ඡේදය ප්‍රකාරව මාසික කඩ කුලිය සෑම මසකම 25 වන දින ගෙවිය යුතු බැවින් වර්ෂ අවසානයට හිඟ ආදායමක් නොපැවතිය යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශ තුල ලැබිය යුතු කඩ කුලී ආදායම ලෙස රු.750,149 ක් හඳුනාගෙන තිබුණි.	රණජයපුර වෙළඳ සංකිර්ණයේ හිඟකුලිය සැබැදිව එම පරිපාලන කාර්යාලය දැනුවත් කර ඇති අතර මේවනවිට එම හිඟ කඩකුලි ආදායම් මෙම අරමුදල වෙත ලැබෙමින් පවත්නා බව.	ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට කඩකුලී ආදායම රැස් කිරීමට කටයුතු කල යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 09 වගන්තිය.	පූර්වෝක්ත වගන්තියේ දැක්වෙන පරිදි අරමුදල විසින් "අපි වෙනුවෙන් අපි අරමුදල" යන නාමයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ	අරමුදලේ සම්ප්‍රේෂණ කුළුණු ආදායම්, නිවාස වාරික, කඩකාමර බදු කුලි සහ පරිත්‍යාග මුදල් ආදිය රැස් කිරිම වානිජ බැංකු වල	පනත ප්‍රකාරව කටයුතු කළයුතු අතර පනතේ වගන්ති ප්‍රායෝගික නොවන අවස්ථා

		අරමුදලක් පවත්වාගත යුතු අතර එකී පනතේ 7 වන වගන්තිය අනුව අරමුදලට ගෙවිය යුතු මුදල් එකී ගිණුමට බැර කරනු ලැබිය යුතු වුවත්, අරමුදල විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුමක් පවත්වා නොතිබුණි.	පවත්නා ගිණුම් හරහා සිදුවන බැවින් ශ්‍රී ලංකා මහ බැංකුවේ නව ගිණුමක් විවෘත කල හොත් ප්‍රායෝගිකව ගැටළු රාශියකට මුහුණ දීමට සිදුවේ.	පවතිනම් සුදුසු සංශෝධන නීත්‍යානුකූලව සිදුකරගත යුතුය.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 1/2020 මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(1)(ඇ)	ඉදිරි වර්ෂයේ අයවැය ලේඛණය අරමුදලේ අරමුණට අනුව පිළියෙල කර පාලක මණ්ඩලයේ අනුමැතිය සහිතව පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2024 වර්ෂයේ අයවැය ලේඛණය ඉදිරිපත් කිරිම 2023 නොවැම්බර් 27 දක්වා ප්‍රමාද කර තිබුණු අතර පාලක මණ්ඩලයේ අනුමැතිය රහිතව ඉදිරිපත් කර තිබුණි.	2024 වර්ෂයේ අයවැය ලේඛණය 2023.09.26 දින ජනාධිපති හා ආරක්ෂක අමාත්‍ය වරයා වෙත ඉදිරිපත් කරන ලද නමුත් 2023.11.24 දිනැති අනුමැතිය සහිතව මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලද බව සහ 2023.05.30 සිට 2024.12.16 දින දක්වා කළමනාකරණ මණ්ඩල රැස්වීම් නොපැවැත්වීම හේතුවෙන් අනුමැතිය රහිතව මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ බව සහ 2024 වර්ෂයේ අයවැය ලේඛනය 2024.12.17 දින කළමනාකරණ මණ්ඩලය අනුමත කළ බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි වර්ෂයේ අයවැය පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 ට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.
(ඇ)	2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(1) , (2) හා (4) වගන්ති.	පූර්වෝක්ත වගන්ති ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කළයුතු අතර 11 (4) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ යෝජනා සම්මතයක් මඟින් මූල්‍ය ප්‍රකාශ අනුමත කරනු ලැබිය යුතු වුවත් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ පාලක මණ්ඩල රැස්වීමක යෝජනා සම්මතයක් මඟින් අනුමත කර නොතිබුණි.	2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අරමුදලේ සභාපති ඇතුළු පාලක මණ්ඩල සමාජිකයන්ගේ අත්සන් සහිතව විගණනයට ඉදිරිපත් කර ඇති බව සහ ඉදිරියේදි පැවැත්වීමට නියමිත 33 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර 2024 මූල්‍ය ප්‍රකාශන සඳහා ආවරණ අනුමැතිය ලබාගැනිමට කටයුතු කරනු ලබන බව.	පනත ප්‍රකාරව කටයුතු කර පාලක මණ්ඩලයේ යෝජනා සම්මතයක් මඟින් මූල්‍ය ප්‍රකාශ අනුමත කර ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(ඈ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(2)(ඇ) හි සඳහන් මාර්ගෝපදේශ අංක 04 හි 6(ආ) ඡේදය.	මූල්‍ය ප්‍රකාශන භාෂා ත්‍රිත්වයෙන් සකස්කර ඉදිරිපත් කළ යුතු වුවද 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සිංහල භාෂාවෙන් පමණක් ඉදිරිපත් කර තිබුණි.	2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට පරිවර්තනය කිරීම සඳහා යොමුකර ඇති බැවින් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව භාෂා ත්‍රිත්වයෙන්ම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.

1.8 මුදල් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අරමුදල විසින් මහජන පරිත්‍යාග රැස්කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් තුනක 2018 වර්ෂයේ සිට 2024 දක්වා කාලය තුළ පරිත්‍යාග වශයෙන් ලැබුණු රු. 1,141,318 ක මුදලක් ශේෂව පැවතුණි. මෙම ගිණුම් ආශ්‍රිතව වර්ෂය තුල හෝ පූර්ව වර්ෂයන්හිදී කිසිදු ගෙවීමක් සිදු නොවූ බැවින් අවම තැන්පතුවක් පවත්වා ගනිමින් අතිරික්ත මුදල් ඵලදායි ලෙස ආයෝජනයක යෙදවීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.	මෙම ගිණුම් මෙහෙයවීම සඳහා බලය ලබාදී ඇති නිලධාරින් මේ වන විට අරමුදලහි රාජකාරි සිදුකරනු නොලබන බැවින් නව නිලධාරින්ගේ නාම යෝජනා අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන බව හා ඉන් අනතුරුව ඵලදායි ආයෝජන මාර්ගයක යෙදවීමට කටයුතු කරනු ලබන බව.	අතිරික්ත අරමුදල් ඵලදායී ලෙස ආයෝජනය කිරීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.
(ආ)	අරමුදල විසින් පවත්වාගනු ලබන අරමුදල් කළමනාකරණ ඉතිරිකිරීමේ ගිණුමේ අතිරික්ත ලෙස මුදල් ශේෂ පවත්වාගෙන තිබූ බව නිරීක්ෂණය වූ අතර, 2024 මුල් අර්ධ වර්ෂය තුළ රු. මිලියන 06 සිට 13 දක්වා පරාසයක ශේෂයක්ද, දෙවන අර්ධ වර්ෂය තුළ රු. මිලියන 12 සිට 37 දක්වා පරාසයක ශේෂයක්ද පවත්වා ගෙන තිබුණි. මේ සඳහා අවම පොලී අනුපාතයක් මත පොලී ලැබී ඇතත් අතිරික්ත මුදල් කෙටිකාලීන ආයෝජන වල යෙදවීමෙන් ආදායම් රැස් කිරීමට කටයුතු කර නොතිබුණි.	ඒ ඒ අවස්ථාවන්හිදී ගෙවීම් කිරීමට අවශ්‍යවන ප්‍රමාණවත් මුදලක් පමණක් ගිණුම තුල පවත්වාගෙන යනු ලබන බව හා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් යම් මුදලක් රඳවා තබාගැනීම ඕනෑම ව්‍යාපාරයක/සංවිධානයක අවශ්‍යතාවය වන අතර පුරෝකථනය කල නොහැකි තත්ත්වයන් තුල ඇතිවිය හැකි අවිනිශ්චිතතා හේතුකොට ගෙන මූල්‍ය අතිරික්තතා/ඌනතා ඇතිවිය හැකි බව.	සැලසුම් කල කාලවකවානු තුල අදාල වියදම් දැරීමට හා අතිරික්ත අරමුදල් වඩා වාසිදායක ලෙස ආයෝජනය කිරීමට හැකිවන පරිදි විධිමත් අරමුදල් කළමනාකරණයක් පවත්වාගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 119,816,332 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.75,144,999 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.44,671,333 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා නිවාස ආධාර මුදල් ගෙවීම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.142,728,695 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. ආයෝජන මත පොලී ආදායම රු. 95,118,015 කින් අඩුවීම හේතුවෙන් ඉහල අතිරික්තයක් වාර්තා කිරීමට නොහැකි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව 2024 වර්ෂය අවසාන වන විට අර්ධ නිවාස 300 ක් හා පූර්ණ නිවාස 20 ක් සඳහා රු.340,000,000 ක ආධාර මුදල් ගෙවා අවසන් කිරීමට සැළසුම් කර ඇතත් 2024 දෙසැම්බර් 31 දින වනවිට සමාලෝචිත වර්ෂයට අදාලව රු.108,303,531 ක් හා 2022 හා 2023 වර්ෂවලට අදාලව රු. 9,050,456 ක් තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි.	2021 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්වය සහ 2022 වර්ෂයේ රටෙහි පැවති ආර්ථික අස්ථාවරභාවය මත භාණ්ඩ මිල ගණන් ඉහල යාම ලිපි ගොනු අඩු පාඩු, බුද්ධි අංශ රහස්‍ය වාර්තා ප්‍රමාදය ඇතුළු පරිපාලනමය ගැටළු හේතුවෙන් 2024 වර්ෂයේ නිවාස ව්‍යාපෘතිය සැලසුම් කල පරිදි අවසන් කිරීමට අපහසු වූ අතර ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදු කිරීමට උපදෙස් ලබා දී ඇති බව.	ක්‍රියාකාරී සැලැස්මට අනුව ඒ ඒ වර්ෂයේ සැලසුම් කළ අපේක්ෂිත ඉලක්ක ඉටුකරගත යුතුය.
(ආ)	රණජයපුර නිවාස සංකීර්ණයේ නිවාස සඳහා සාමාජිකයන් 131 ක් වාරික මුදල් ගෙවා අවසන් බවට වාර්තාගතව පැවති අතර දෙපාර්ශවය විසින් එළඹි ගිවිසුමේ 2 වන වගන්තිය ප්‍රකාරව වාරික ගෙවා අවසන් කළ පුද්ගලයන් වෙත නිවාසවල අයිතිය පැවරිමේ කටයුතු අවසන් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද අපොහොසත්ව තිබුණි.	ආරක්ෂක අමාත්‍යාංශයේ සෘජු මැදිහත්විමෙන් මේ වන විට ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ ඉඩම් අමාත්‍යාංශය යන රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වී රණජයපුර නිවාසලාභින් සඳහා හිමිකම් සහතික ලබාදීමේ ක්‍රියාවලිය කඩිනමින් සිදු කිරීමට කටයුතු කරගෙන යනු ලබන බව.	වාරික මුදල් ගෙවා අවසන් තැනැත්තන් වෙත ගිවිසුම් ප්‍රකාරව නිවාස අයිතිය පවරාදීමට කඩිනමින් කටයුතු කළ යුතුය.
(ඇ)	නිවාස ආධාර පිරිනැමීම සඳහා තෝරාගත් පුද්ගලයන් නියමිත සුදුසුකම් සපුරා ඇති බවට හා සපයා ඇති සියළු තොරතුරු නිවැරදි හා සත්‍ය බවට තහවුරුවන පරිදි එක් එක් පුද්ගලයා වෙනුවෙන් ලිපිලේඛණ පවත්වාගත යුතු වුවත් අරමුදල විසින් පවත්වා තිබුණු ලිපිගොණු එම අවශ්‍යතාවන් සපුරාලන පරිදි පවත්වා නොතිබුණු අතර ලිපිගොනු තුල සහතික නොකළ ඡායා පිටපත් පැවතීම, අදාල නිර්දේශ රහිත අයදුම්පත් පැවතීම හා සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ බව සනාථ නොවීම වැනි අඩුපාඩු සහිත විය.	අරමුදල යටතේ ක්‍රියාත්මකව පවතින නිවාස ව්‍යාපෘතියන් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ කටයුතු රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂක සහ මණ්ඩලය සහ අනෙකුත් සුභසාධක අංශ විසින් සිදු කරන අතර තෝරාගන්නා ලද රණවිරුවන්ගේ ලිපිගොණු අරමුදල වෙත ඉදිරිපත් කර ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කරනු ලබන බව.	තෝරාගත් පුද්ගලයන් නියමිත සුදුසුකම් සපුරා ඇති බවට හා සපයා ඇති සියළු තොරතුරු නිවැරදි හා සත්‍ය බවට තහවුරු විය යුතුය.
(ඈ)	අරමුදල විසින් ක්‍රියාත්මක කරනු ලබන නිවාස ආධාර ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ප්‍රතිලාභීන් වෙත අරමුදල විසින් සෘජුව ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු අතර පූර්ව වර්ෂවලට හා සමාලෝචිත	ප්‍රතිලාභියා විසින්ම ලද මුදල සඳහන් කර ඇගයීම් පත්‍රයක් ග්‍රාමසේවා නිලධාරී, ප්‍රාදේශීය ලේකම්, අදාළ හමුදාවේ ඒකක අණදෙන නිලධාරී, සුභසාධක අධ්‍යක්ෂ හා මෙම අමාත්‍යාංශය මගින් පත් කර ඇති සම්බන්ධීකරණ නිලධාරීන්ගේ	ප්‍රතිලාභියා වෙත අරමුදල විසින් සෘජුව ප්‍රතිලාබ ගෙවීමේ ක්‍රමවේදයක් හා ප්‍රතිලාභ නිවැරදිව ලද බවට තහවුරු කෙරෙන

වර්ෂයට අදාලව රු.මිලියන 283.22 ක් සමාලෝචිත වර්ෂයේ දී ත්‍රිවිධ හමුදාවල සහ පොලිසියේ තැන්පතු ගිණුම් වෙත මුදා හැර තිබුණි තවද, නිවාස ආධාර ලබාගත් පුද්ගලයන් වෙත ප්‍රතිලාභ මුදල් ලැබුණු බව, බාහිර පාර්ශව හරහා ගෙන්වා ගනු ලබන ලිපියක් මගින් පමණක් තහවුරු කිරීම සහ ඒ සඳහා සැලකිය යුතු කාලපමාවක් සිදුවීම හා එසේ ගෙන්වා ගනු ලබන ලිපිවල සඳහන් අත්සන් සහ සෙසු තොරතුරු නිවැරදි බවට සතුටුදායක ලෙස නිරීක්ෂණය කළ නොහැකි තත්වයක් පැවතුණි.	නිර්දේශයෙන් අනතුරුව මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන බව සහ අර්ධ නිවාස ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් වෙත අදියරයන් සඳහා මුදල් නිදහස් කිරීමේදී අදාල මුදල් ප්‍රතිලාභියාට ලද බවට ප්‍රතිලාභියාගේ අත්සනින් යුතුව මුදල් ලද බවට සනාථ කිරීමේ ලිපියක් සම්බන්ධීකරණ නිලධාරිගේ අත්සනින් යුතුව මෙම අරමුදල වෙත ලබාගනු ලබන බව.	ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළයුතු වීම.

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ආරක්ෂක හමුදා කඳවුරු පිහිටි ඉඩම් තුළ ස්ථානගත කර තිබුණු සම්ප්‍රේශණ කුළුණු 49 ක් අශ්‍රිතව විදුලි සංදේශ යටිතල පහසුකම් ක්‍රියාත්මක කර කළමණාකරණය කිරීම සඳහා අරමුදල විසින් බාහිර දූරකථන සමාගම් 03 ක් සමග ගිවිසුම්ගතව තිබුණු අතර එමගින් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 166.68 ක ආදායමක් අරමුදලට ලැබී තිබුණි. එහෙත් බාහිර දූරකථන සමාගම් සමග ගිවිසුම්ගත වීමට හා එමගින් ජනිත ආදායම අරමුදලේ ආදායමක් ලෙස සැලකීම සඳහා බලය පැවරෙන නිශ්චිත අධිකාරය පිළිබඳව අනාවරණය නොවුණි.	සන්නිවේදන කුළුණු සමාගම් සමග ඇතිකරගත් අවබෝධතා ගිවිසුම්වල වගන්ති ප්‍රකාරව 2008 අංක 6 දරන ''අපි වෙනුවෙන් අපි අරමුදල'' වෙත මුදල් ගෙවීම සිදුකල යුතු බවට ගිවිසුම් ගත වී ඇති බව සහ අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 7 (ඊ) වගන්තිය ප්‍රකාරව වෙනත් ලැබීම් යටතේ බලය පැවරෙන බව.	දූරකථන සමාගම් සමඟ ගිවිසුම්ගතවීමට සහ ඒකාබද්ධ අරමුදලට බැර විය යුතු ආදායම් අරමුදලේ ආදායම් ලෙස සැලකීම සඳහා වන නිශ්චිත අධිකාරී බලය පිළිබඳව අනාවරණය විය යුතුය.

4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(6) වගන්තිය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් අරමුදල ආරම්භයේ සිට 2023 වර්ෂය දක්වා වූ වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	2008 අංක 06 දරන "අපි වෙනුවෙන් අපි" අරමුදල් පනතේ 11(6) වගන්තිය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අදාළ ලිපි ලේඛන මේවන විට සකස් කරමින් පවතින බව.	2008 අංක 06 දරන අපි වෙනුවෙන් අපි අරමුදල් පනතේ 11(6) වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය.